# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.01 පැය 1320 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1973/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**සමාජ මාධ්‍ය මඟින් සංසරණය වන වීඩියෝපටයක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම.**

රථවාහන වරදක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් කාර් රථයක් නවත්වන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නම සඳහන් කරමින් සහ එම කාන්තාව අදාළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ නැගණිය බව පවසමින් පොලිස් රාජකාරියට බාධා කරමින් හැසිරන වීඩියෝවක් මේ වන විට සමාජ්‍ය මාධ්‍ය ඔස්සේ සංසරණය වෙමින් පවතී.

මෙම වීඩියෝපටයට අදාළ සිදුවීම 2025.10.31 වන දින ගම්පහ පොලිස් වසමේ කොටුගොඩ උඩුගම්පොළ මාර්ගයේ සිදුව ඇති අතර, කාර් රථයක් පදවාගෙන පැමිණි කාන්තාවක් රථවාහන වරදක් සම්බන්ධයෙන් නැවැත්වීමට සංඥා කිරීමේදී, කාර් රථය නොනවත්වා ධාවනය කර ඇති අතර පසුව රථ වාහන නිලධාරීන් විසින් මෙම කාර් රථය පසුපස හඹා ගොස් උඩුගම්පොල ප්‍රදේශයේදී නවත්වා පරීක්ෂා කරන අවස්ථාවේදී මෙසේ හැසිරී ඇත.

අනතුරුව මෙම ස්ථානයෙන්ද මෙම කාන්තාව පොලිස් අණ නොතකා රථය ඉදිරියට ධාවනය කර ඇති අතර මිනුවන්ගොඩ පොලිස් වසමේ පොල්වත්ත හන්දිය ප්‍රදේශයේදී රථය නවත්වාගෙන මෙම සැකකාර කාන්තාව එම අවස්ථාවේදී අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. සැකකාර කාන්තාව, ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ නැගණිය ලෙස සිදු කරන ප්‍රකාශය සම්පූර්ණයෙන් අසත්‍යයක් වන අතර එවැනි කිසිම සබඳතාවයක් අනාවරණය වී නොමැත.

ඒ අනුව, සැකකාරිය අන්තරාදායක ලෙස රිය ධාවනය, අපරීක්ෂාකාරී රිය ධාවනය, පොලිස් සංඥා නොතකා ධාවනය, සාපරාධී බලහත්කාරය පෑම හා අන්අයෙකු ලෙස පෙනී සිටීම යන චෝදනා යටතේ 2025.11.01 වන අද දින ගම්පහ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**